**ශීර්ෂය 258 - මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ**
**විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**
**-----------------------------------------------------**

## 1.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්

(අ) දිස්ත්‍රික් පරිපාලනය

(ආ) ව්‍යවස්ථාපිත කටයුතු

(ඇ) අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරිම

(ඈ) ආගමික හා සදාචාර සංවර්ධනය

(ඉ) සේවක සුභසාධනය

(ඊ) සම්බන්ධිකරණ හා මිත්‍රශිලි පරිපාලනය

(උ) සංවර්ධන වැඩසටහන් හා ගම නැඟුම

(ඌ) රාජ්‍ය නොවන සංවිධාන හා ප්‍රජා සහභාගිත්වය

(එ) මාධ්‍ය සම්බන්ධීකරණය

(ඒ) පරිපාලනයේ ආකල්ප වර්ධනය හා පුහුණුව

(ඔ) තොරතුරු තාක්ෂණය භාවිතය

## 1.2. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශිය ලේකම් කාර්යාල

(අ) ගඟවට කෝරළේ

(ආ) පාතහේවාහැට

(ඇ) දෙල්තොට

(ඈ) උඩපළාත

(ඉ) උඩුදුම්බර

(ඊ) පාතදුම්බර

(උ) පන්විල

(ඌ) හතරලියද්ද

(එ) පූජාපිටිය

(ඒ) තුම්පනේ

(ඔ) මිනිපේ

(ඕ) කුණ්ඩසාලේ

(ක) දොළුව

(ග) ගඟඉහළ කෝරළේ

(ච) යටිනුවර

(ජ) උඩුනුවර

(ට) හාරිස්පත්තුව

(ඩ) අකුරණ

(ණ) මැදදුම්බර

(ත) පස්බාගේ කෝරළේ

## 1.3. විගණන විෂය පථය

මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1)

ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 අගෝස්තු 26 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.5 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඉ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.6 සිට 1.14 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙළ කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) විසර්ජන ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

#### (i) මුළු ප්‍රතිපාදනය හා වියදම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.1,044,044,400ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.1,021,638,358 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.22,406,042ක් හෙවත් සියයට 2 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 922,394,400 | 922,392,630 | 1,770 | 00 |
| මූලධන | 121,650,000 | 99,245,728 | 22,404,272 | 18 |
| **එකතුව** | **1,044,044,400** | **1,021,638,358** | **22,406,042** | **02** |

(ii) **අයවැය විචලනය**

වැය විෂයයන් 3 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන සංශෝධනය නොකිරීමේ හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්වලට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 8 සිට සියයට 26 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ආ) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 27 ක් හා දෙපාර්තමේන්තු 18 ක් විසින් එකතුව රු.4,477,955,869 ක් වූ ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබුණු අතර, එම ප්‍රතිපාදන පිළිවෙලින් රු.2,259,398,406 ක් හා රු.1,885,041,308 ක් වශයෙන් එකතුව රු.4,144,439,714 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට පිළිවෙලින් රු.294,707,096 ක් හා රු.38,809,059 ක් වශයෙන් එකතුව රු.333,516,155 ඉතිරි වී තිබුණි. එම ඉතිරිවීම් ලබාදී තිබුණු ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 11.54 ක් හා සියයට 2.02 ක් වී තිබුණි.

(ඇ) **රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තු විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 25801 | 65,000,000 | 60,972,925 | 49,000,000 | 60,045,982 | 244,000,000 | 190,320,942 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම 2013 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව, මිය ගිය හා විශ්‍රාම ගිය නිලධාරින් 12 දෙනෙකුගෙන් වර්ෂ 08 කට ආසන්න කාලයක් හිඟහිටි රු.730,095 ක ණය ශේෂ අයකර ගැනිමට 2013 දෙසැම්බර් 31 දින වන විටත් කාර්යාලය කටයුතු කර නොතිබුණි.

**(ඉ) පොදු තැන්පත් ගිණුම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුමේ ශේෂය රු.253,099,653 ක් විය. එම ශේෂය තුළ වර්ෂ 2 ක කාලයක් ඉකුත් වූ එකතුව රු.30,700,654 ක්වූ තැන්පතු 73 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 1.6 යහපාලන හා ගිණුම් කටයුතුභාවය

### 1.6.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

2010 මාර්තු 10 දිනැති අංක පිඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ 1.4.1 ඡේදය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරි සැලැස්ම 2013 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 1.6.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව 2013 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2013 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

## 1.7 වත්කම් කළමනාකරණය

### (අ) නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

පහත වර්ග කර ඇති වත්කම් නිෂ්ක්‍රියව හෝ ඌන උපයෝජිතව පැවැති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රියව හෝ ඌන උපයෝජිතව පැවැති කාලය |
|---|---|---|
| යන්ත්‍ර සූත්‍ර (එළවළු විජලන යන්ත්‍ර) | 06 | 2008 නොවැම්බර් 21 දින සිට |
| සහල් අඹරණ යන්ත්‍ර | 04 | වර්ෂ 02 |
| කාර්යාලයීය ගෘහ භාණ්ඩ | 40 | වර්ෂ 01 |

### (ආ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඇතැම් වත්කම් අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන් වෙත මුදා හැර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| වත්කම් වර්ගය | වත්කම් සංඛ්‍යාව | වත්කම් ලබා දී ඇති ආයතන | කාල පරිච්ඡෙදය |
|---|---|---|---|
| මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් අතිරේක දිස්ත්‍රික් ලේකම් සඳහා වූ රජයේ නිවස | 01 | ශ්‍රී ලංකා යුධ හමුදා පොලිස් සේවා බලකාය | 2003 පෙබරවාරි 01 දින සිට මාස 6ක සීමාවකට මුදා හැර තිබූ නමුත්, එම නිවස 2014 අගෝස්තු වන විටත් ආපසු භාරදී නොතිබුණි. |

### (ඇ) බේරුම් නොකළ බැරකම්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2013 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01ට අඩු බේරුම් නොකළ බැරකම් රු.2,228,215 ක් වී තිබුණි.

1.8 **අනුකූල නොවීම**

**නීතී, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීතී,රීති සහ රෙගුලාසිවලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| (i) | 2008 ජූලි 26 දිනැති අංක 13/2008 දරන චක්‍රලේඛයේ 04 ඡේදය | 96,216 | මිනිපේ ප්‍රාදේශීය ලේකම් විසින් මාසික ඉන්ධන දීමනාවට අමතරව විධිමත් අනුමැතියක් රහිතව අතිරේක ඉන්ධන දීමනා වශයෙන් රු.96,216ක් 2013 වර්ෂයේදී ලබාගෙන තිබුණි. |
| (ii) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛය | - | ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2013 දෙසැම්බර් 03 දින වන විටත් පැමිණීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කර නොතිබුණි. |
| (iii) | 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන චක්‍රලේඛය | - | මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09කට අනුයුක්තව සේවය කරන නිලධාරීන් 111 දෙනෙක් සඳහා චක්‍රලේඛයේ සඳහන් පරදි ස්ථාන මාරුවීම් ලබා දී නොතිබුණි. |
| (ආ) | **රාජ්‍ය මුදල් චක්‍රලේඛය** | | |
| | 2009 සැප්තැම්බර් 18 දිනැති අංක පීඑෆ්/477 දරන චක්‍රලේඛය | - | පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කර්යාලයේ සරප් භාරයේ තිබූ සේප්පුව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ හෝ රක්ෂණ භාර අරමුදලෙහි රක්ෂණය කර නොතිබුණි. |

1.9 **ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා**

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම හා ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් පිළිබඳ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

**(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම**

---------------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර තිබුණි.

| | ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළයුතු වූ දිනය | ආරම්භ නොකිරීමට හේතු |
|---|---|---|---|---|
| | | රු. | | |
| (i) | **උඩපළාත ප්‍රාදේශිය ලේකම් කාර්යාලය සහ ගඟඉහළ කෝරළේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය** | | | |
| | විසිතුරු මත්ස්‍ය වගාව සහ ආහාර සඳහා මත්ස්‍ය වගාව | 306,000<br>164,500<br>------------<br>470,500<br>======= | 2011/2012 | ධීවර කර්මාන්ත වැඩසටහන යටතේ තෝරා ගත් ප්‍රතිලාභීන්ට ණය මුදල් ලබාදීමෙන් පසු සැලැසුම්වලට අනුව පසුවිපරම් ක්‍රියාවලියක් ප්‍රාදේශිය ලේකම් කාර්යාලය හා දිස්ත්‍රික් ජලජීවි වගා ව්‍යාපෘති කාර්යාලය ඒකාබද්ධව ක්‍රියාත්මක කර නොතිබුණි. මේ නිසා ප්‍රතිලාභීන් විසිතුරු මත්ස්‍ය වගා ව්‍යාපෘතියට දක්වන උනන්දුව අඩුවීම නිසා ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි. |
| (ii) | **යටිනුවර කෝරළේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය** | | | |
| | - වහරක්ගොඩ මහ ඇළ ජල දිගුව | 50,000 | 2013.12.18 | ජල සම්පාදන මණ්ඩලයෙන් ඇස්තමේන්තු මුදල් නොලැබීම. |
| | - පැලව ඉහළ මැද මාතෘ හා ළමා සායනය මධ්‍යස්ථානය සංවර්ධනය | 150,000 | 2013.11.20 | මුදල ප්‍රමාණවත් නොවීම |
| | - දන්තුරේ ඔමැන්ඩල් ජනපද මාර්ගය | 150,000 | 2013.08.07 | පස් වැඩ කිරීමට යෝජනාව සංශෝධනය නොවීම. |

| | | | | |
|---|---|---|---|---|
| **(iii)** | **උඩුනුවර ප්‍රාදේශිය ලේකම් කාර්යාලය** | | | |
| | වටදෙණිය සුසාන භූමිය පාර සංවර්ධනය කිරිම | 48,500 | 2003.12.13 | ගිවිසුම්ගත සංවිධානය 2013.12.31 දින වන විටත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට උනන්දු නොවීම. |
| **(iv)** | **කුණ්ඩසාලේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය** | | | |
| | - බලගොල්ල නැගෙනහිර අභිත ක්‍රිඩාගාරය විදුලි රැහැන් ඇදීම, විදුලිය හා ජලය ලබා ගැනිම | 65,000 | 2013.12.25 | ව්‍යාපෘති යෝජනාව අනුමත වි මුදල් ලැබීමට ප්‍රමාදවීම. |
| | - කුමුදු මාවතේ අතුරු මාර්ගය කොන්ක්‍රිට් කිරිම | 198,000 | 2013 | පෞද්ගලික ඉඩමක් හරහා ක්‍රියාත්මක කළයුතු වීම. |
| | - බුදුගේහින්න ධර්මාරාම උපාසිකාරාමයේ පඩිපෙළ ඉදිකිරිම | 495,000 | 2013 | ව්‍යාපෘති භූමියට ද්‍රව්‍ය ප්‍රවාහනය අපහසුවීම නිසා අවිච්ඡේද කිරීමට අනුමැතිය ඉල්ලා තිබුණත්, අනුමැතිය ලැබී නොතිබීම. |
| **(v)** | **දෙල්තොට ප්‍රාදේශිය ලේකම් කාර්යාලය** | | | |
| | - නවනැලිය සිට කොටගේපිටිය ගුරුගල්ඔය දක්වා ඉදිකර ඇති වෙළමැද සපත්තුපාලම අළුත්වැඩියා කිරීම | 72,750 | 2013.07.16 | ව්‍යාපෘති සංශෝධනය කර ගැනීමට නොහැකිවීම. |
| | - පතම්පල්ලි කන්දතැන්න වත්තේ ජල යෝජනා ක්‍රමය වැඩිදියුණු කිරිම | 485,000 | 2013.08.15 | ව්‍යාපෘති සංශෝධනය කර ගැනීමට නොහැකිවීම. |

(ආ) **ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

-----------------------------------

**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.**

| | ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ගත පිරිවැය | ආරම්භ කළයුතු වූ දිනය | නිම කළ යුතු දිනය | 2013 දෙසැම්බර් 31 දින වන විට වියදම | අත්හැර දැමීමට හේතු |
|---|---|---|---|---|---|---|
| | | රු. | | | රු. | |
| (i) | **කුණ්ඩසාලේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය** | | | | | |
| | දැලිවලතැන්න මාදගම්මැද්ද කොටසේ තල්මැඩියාවෙල හරහා පිහිඹියගහ මන්සන්දියේ සිට ගම්සභා පාර සංවර්ධනය | 297,000 | 2013.11.25 | 2013.12.25 | 17,246 | ව්‍යාපෘති භූමියට ද්‍රව්‍ය ප්‍රවාහනය අපහසුවීම. |
| (ii) | **උඩදුම්බර ප්‍රාදේශිය ලේකම් කාර්යාලය** | | | | | |
| | - බඹරබැද්ද නැගෙනහිර ගම්මැද්ද මාර්ගයයේ ඉතිරි කොටස ප්‍රතිසංස්කරණය කිරිම | 1,200,246 | 2012.08.30 | 2013.06.28 | 974,400 | අධික වර්ෂාව |
| | - බඹරබැද්ද බටහිර ගම්මැද්ද මාර්ගය ප්‍රතිසංස්කරණය කිරිම | 1,201,782 | 2012.08.30 | 2013.06.27 | 974,000 | -එම- |
| | - මඩුගල්ල උතුර ජල යෝජනා ක්‍රමය වැඩිදියුණු කිරිම | 1,015,483 | 2012.08.30 | 2013.07.12 | 974,000 | -එම- |
| | - කයිකාවල ජල යෝජනා ක්‍රමය වැඩිදියුණු කිරිම | 1,317,987 | 2012.08.30 | 2013.08.06 | 974,000 | -එම- |
| | - නුගේතැන්න ගල්බොක්ක මාර්ගය ප්‍රතිසංස්කරණය කිරිම | 1,198,942 | 2012.11.30 | 2013.05.29 | 974,000 | -එම- |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | - දේවින්නේගම බහු කාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම | 986,805 | 2012.08.27 | 2013.11.07 | 971,344 | -එම- |
| | - කපු පැල 10775 ක් මිලදී ගෙන 2013 වර්ෂය තුළදී සිටුවීම | 2,237,500 | 2013.12.26 සිට 2013.12.30 දක්වා | 2013.12.31 | 1,102,000 | කපු පැල 5265ක් මිලදී ගෙන නොතිබීම |
| (iii) | **පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය** | | | | | |
| | උත්තුපිල සිට මහකුඹුරේ රේල් පාර දක්වා මාර්ගය ඉදිකිරීම | 500,000 | 2013.11.06 | 2013.12.31 | 500,000 | නියමිත ප්‍රමිතියට අනුකූලව වැඩ අවසන් නොකිරීම හේතුවෙන් ගෙවීම් නොකිරීම. |

**(ඇ) මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

දොළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පන්විලතැන්න කහවත්ත විහාරස්ථානයේ දහම් පාසල සංවර්ධන කිරිමේ කර්මාන්තය සඳහා රු.150,000 ක ප්‍රතිපාදනවලින් රු.145,354 ක වියදමින් ටයිල් ලබාගෙන තිබුණද, 2013 දෙසැම්බර් 12 දින වන විටද ටයිල් ඇල්ලීමට කටයුතු කර නොතිබුණි. එහෙත් මෙම කටයුත්ත නිම කර ඇති බවට වැඩ වාර්තා සකස් කර තිබුණි.

## 1.10 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

උඩුදුම්බර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් අතිරේක දිස්ත්‍රික් රෙජිස්ටාර් කාර්යාලය පවත්වාගෙන ගිය ගොඩනැගිල්ලේ වහලය,දොර ජනෙල් හා වැසිකිළි පද්ධති අළුත්වැඩියා කිරිම සඳහා රු.849,797 ක ඇස්තමේන්තු සකස් කර තිබුණි. 2013 පෙබරවාරි 14 දින එම ඇස්තමේන්තුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත යොමුකර තිබුණත්, විගණන අවස්ථාව වු 2014 මාර්තු 25 දින වන විටත් වසරකට අධික කාලයක් ගතවී තිබුණත්, එම අළුත්වැඩියාව සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. මේ හේතුව නිසා ගොඩනැගිල්ල දිනෙන් දින ගරා වැටිමට ලක් වී තිබුණි.

1.11 **අවිධිමත් ගනුදෙනු**

----------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) **ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම්**

----------------------------------------------------------------------------------------

2013 මැයි 22 දිනැති ප්‍රසම්පාදන තීරණ අංක 201 මඟින් අවම මිල ගණන් ඉදිරිපත් කර තිබුණු ආයතන දෙකකින් රු.406,050 බැගින් වූ ඇණවුම් 2 ක් මඟින් ටෝනර් 90 ක් මිලදී ගෙන තිබුණි. ප්‍රසම්පාදන කමිටුවේ තීරණය වූ මිල ගණන් මත 2013 දෙසැම්බර් 21 දින ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියකින් තොරව තවත් ටෝනර් 58 ක් එම මිලට වෙනත් ආයතනයකින් රු.359,698 කට මිලදී ගෙන තිබුණි.

(ආ) **අධිකාරි බලය නොමැති වූ ගනුදෙනු**

----------------------------------------

ගහඉහළ කෝරළේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් පළාත් සභා සේවකයෙකුට 2013 වර්ෂයේදී මධ්‍යම රජයේ ශීර්ෂයෙන් වැටුප් රු.263,784ක් හා ආපදා ණය රු.53,820 ක් ගෙවා තිබුණි.

1.12 **පාඩු හා හානි**

----------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) උඩදුම්බර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ දිවි නැගුම වැඩසහන යටතේ පශු වෛද්‍ය නිලධාරි විසින් ලබාදුන් නිරීක්ෂණ සැලකිල්ලට නොගෙන 2013 වර්ෂය තුළ මසක් වයසැති කිකිළි පැටවුන් ප්‍රතිලාභීන්ට බෙදා දී තිබුණි. 2014 මාර්තු 30 දින වන විට පැටවුන් 1,002 ක් මිය යෑම හේතු කරගෙන රු.345,150ක පාඩුවක් සිදු වී තිබුණි. 2012 වර්ෂය තුළදී ද පශු වෛද්‍ය නිලධාරියෙකුගේ නිර්දේශය නොමැතිව රු.362,220 ක් වැය කර මසක් වයසැති කිකිළි පැටවුන් මිලදී ගෙන තිබුණි.

(ආ) මිනිපේ ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශයේ දිවි නැගුම වැඩසටහන යටතේ 2013 වර්ෂයේ ධිවර කර්මාන්තය සඳහා ප්‍රතිලාභීන් 6 දෙනෙකු සඳහා රු.256,500 ක ණය සහ සහනාධාර ගෙවා තිබුණි. එයින් ප්‍රතිලාභීන් 06 දෙනෙකුට ලබාදී තිබුණු ණය මුදල්වලින් 2013 දෙසැම්බර් 31 දින වන විට ප්‍රතිලාභීන් හයදෙනෙකුගෙන් රු.78,000 ක් අය කර ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අපොහොසත් වී තිබුණි.

(ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු වාහනය 2013 ජුලි 18 දින අනතුරට ලක්වීමෙන් 2013 සැප්තැම්බර් 03 දින රු.9,284 ක් වැය කර අළුත්වැඩියා කර තිබුණි. එම අලාභහානිය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව 2013 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

**1.13 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශ ලේකම්ගේ අංක: 2011 දරන චක්‍රලේඛය ප්‍රකාරව පෙර පාසල් දරුවන් සඳහා නැවුම් කිරි විදුරුවක් ලබාදීමේ වැඩ සටහන ප්‍රාදේශිය ලේකම් කාර්යාල බල ප්‍රදේශවල ක්‍රියාත්මක කළයුතු වුවද, මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09ක් තුළ ලියාපදිංචි පෙර පාසැල් 477 කින් පෙර පාසල් 148 ක මෙම වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණි.

1.14 **මානව සම්පත් කළමනාකරණය**

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි වේ.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 82 | 73 | 09 | - |
| (ii) | තෘතියික මට්ටම | 109 | 69 | 40 | - |
| (iii) | ද්විතියික මට්ටම | 1,702 | 1,308 | 394 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 218 | 183 | 35 | - |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 03 | 09 | - | 06 |
| | උප එකතුව | 2,114 | 1,642 | 478 | 06 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

ප්‍රාදේශිය ලේකම් කාර්යාල 8ක වසර කිහිපයක සිට පවතින පුරප්පාඩුවල 322 ක් පිරවීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අපොහොසත් වී තිබුණි.

**(ආ) රාජකාරී පවරා නොතිබීම**

2013 ජුනි 11 දිනැති අංක: HAF-A/6/GT/Duty List දරන රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව බල ප්‍රදේශයේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කර්යාලවලට අනුයුක්ත කර ඇති උපාධිධාරි සංවර්ධන නිලධාරින්ට රාජකාරී පවරා සේවය ලබාගත යුතු වුවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14කට අනුයුක්ත උපාධිධාරි සංවර්ධන නිලධාරින්ට නියමිත රාජකාරි පවරා නොතිබුණි. මේ හේතුවෙන් එම නිලධාරීන්ට සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණ රු.8,991,987ක වැටුප් හා දීමනා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අරමුණු ඉටු කිරිමට දායක කර ගෙන තිබුණු බව විගණනයේදී තහවුරු නොවුණි.